**මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. - 2023**

**-----------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශ ගත ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි ("සමාගම") සහ සමාගමේ සහ එහි පරිපාලිතයේ ("සමූහය") හි මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ හා එහි පරිපාලිතයේ ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන ඇපවීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් මාගේ විගණකගේ වාර්තාවේ දින තෙක් ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමූහය ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු දෑ

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පින්ගාරා ටවුන් ඇන්ඩ් කන්ට්‍රි ක්ලබ් වෙතින් ලැබිය යුතු පොළී,සේවක ලැබිය යුතු ගිණුම සහ පාරිභෝගික වගකීම් බැංකු ඇපකර ගිණුමට අදාලව දිගු කාලීන ලැබිය යුතු හිඟ ශේෂ එකතුව රු. මිලියන 95.28 ක් වර්ෂ 1 සිට වර්ෂ 5 කට වැඩි කාලසීමාවක් දක්වා හිඟව පවතී. එම දීර්ඝ කාලීන හිඟ ලැබිය යුතු ශේෂයන් පිළිබඳ කාල විශ්ලේෂණය පහත වගුවේ දක්වා ඇත. | **පින්ගාරා ටවුන් ඇන්ඩ් කන්ට්‍රි ක්ලබ්**<br><br>මෙය ආයෝජන දේපල යටතේ ලැබිය යුතු පොළී පින්ගාරා ටවුන් ඇන්ඩ් කන්ට්‍රි ක්ලබ් (ප්‍රයිවට්) ලිමිටඩ්<br><br>2014 මැයි සිට 2014 ඔක්තෝබර් දක්වා පොළිය උපචිතව ඇති අතර රු.110,000,000 ක ප්‍රාග්ධනය අයකරගැනීමට නීතිමය කටයුතු ආරම්භ කර ඇත.<br><br>රු.8,380,000 ක ලැබිය යුතු පොළී සඳහා සම්පූර්ණයෙන් ප්‍රතිපාදන සලසා ඇත.<br><br>**සේවක ලැබිය යුතු**<br><br>* වර්ෂ 5 කට වඩා වැඩි<br>රු. 235,500 - මණ්ඩල අනුමැතිය ඇතිව 2024 මාර්තු මාසයේදී ලියාහැර ඇත. | දීර්ඝ කාලීන ලැබිය යුතු හිඟ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කල යුතු බව නිර්දේශ කෙරේ. |

| විස්තරය | හිඟ කාලසීමාව (වර්ෂ) 0-1 | 1-3 | 3-5 | වර්ෂ 5 ට වඩා වැඩි | එකතුව |
|---|---|---|---|---|---|
| | (රු.මි.) | (රු.මි.) | (රු.මි.) | (රු.මි.) | (රු.මි.) |
| පින්ගාරා ටවුන් ඇන්ඩ් කන්ට්‍රි ක්ලබ් | - | - | - | 8.38 | **8.38** |
| සේවක ලැබිය යුතු | - | 5.77 | 38.80 | 0.24 | **44.81** |

| | | | | | |
|---|---|---|---|---|---|
| පාරිභෝගික වගකීම් | 31.22 | 10.87 | | - | **42.09** |
| බැංකු ඇපකර | | | | | |
| එකතුව | **31.22** | **16.64** | **38. 0** | **8.62** | **95.28** |

.

* කඳාන වංචාව රු.37,160,000
මෙය කඳාන ශාඛාවේ ස්ථිර තැන්පත් වංචාවට අදාලව වේ.- තවමත් නීතිමය ක්‍රියාවලිය යටතේ ඇත.

* ඉල්ලා අස්වී ඇති සේවක බී.ජී.ජී.නිලංග මහතාගෙන් ලැබිය යුතු - රු*.296,000*

නිතිමය ප්‍රතිඵලයක් ලැබෙන තුරු නිරවුල් කිරීම අවසන්ව නැත

* හිමිකම් ගෙවීම - ආර්.ජ්.ජ්.පෙරේරා මහතා -රු.1,347,300

ශීර්ෂගත කාරණය විමර්ශනය කිරීමට සහ පාඩුව අයකර ගැනීම සඳහා **CID** වෙත ප්‍රවේශ වී ඇත. වාහනය විකුණා ඉතිරි මුදලද අයකර ගැනීමට කටයුතු සලසා ඇත.

* ගාල්ල ශාඛාව ලැබිය යුතු කවුළු ණය හිමි රු.839,950.94
මණ්ඩල අනුමැතිය ඇතිව 2024 ජුලි මාසයේදී ලියාහැර ඇත.

*ණය නිරවුල් කිරීම- එකෝ කබානා රු. 2,673,905.65

ගාල්ල එස්සිඅයිබී හි නඩුවක් ගොනු කර ඇත. නඩුව අවසාන අදියරේ පවතී. නිතිමය ප්‍රතිඵලයක් ලැබෙන තුරු නිරවුල් කිරීම අවසන්ව නැත**.**

*අනුරාධපුර ශාඛාව උකස් භාණ්ඩ වංචාව– රු. 2,256,211.07

අනුරාධපුර පොලිසියේ සහ අනුරාධපුර උසාවිවල පරීක්ෂණයක් සහ නඩු විභාගයක් සිදුවෙමින් පවතී. නඩුවට අදාල භාණ්ඩ ලෙස උසාවිය භාරයේ ඇත්තේ රන් භාණ්ඩ ස්වල්පයකි. උසාවි නඩුව දිගටම ක්‍රියාත්මක අතර නඩු විභාගය අවසන් වන තුරු සම්පූර්ණ කිරීම එසේම පවතී.

## 1.5.2 ගෙවිය යුතු දෑ

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හඳුනා නොගත් සෘජු තැන්පතු, ඉදිරිපත් නොවූ ගෙවීම්, පාරිභෝගික එකතු කිරීමේ ගිණුම්, උපලේඛණගත නොවන ගෙවීම් එකතු කිරීම් සහ මියගිය ගනුදෙනුකරුවන්ගේ ගෙවිය යුතු තැන්පතු, උපචිත වියදම් හා කාලීන මුදල් වියපැහැදම් ගිණුම්වලට අදාලව වර්ෂ 1 සිට වර්ෂ 5 ට වැඩි කාලසීමාවක් සඳහා එකතුව රු. මිලියන 143.74 ක දීර්ඝ කාලයක සිට හිඟව පවතින ශේෂ නිරීක්ෂණය විය. එම දීර්ඝ කාලීන හිඟ ශේෂයන් පිළිබඳ කාල විශ්ලේෂණය පහත වගුවේ දක්වා ඇත. | **හඳුනා නොගත් සෘජු තැන්පතු**<br><br>ගණුදෙනුකරුවන් විසින් අපගේ බැංකු ගිණුම්වලට කරන ලද හඳුනා නොගත් සෘජු තැන්පතු මෙහි ඇතුලත් වේ.<br><br>පවත්නා තොරතුරු සමග හඳුනාගැනීම සඳහා මේවා ශාඛා වෙත යවා ඇත.<br><br>වර්තමාන දිගුකාලීන හිඟ ශේෂ ප්‍රතිපත්තියට අනුව,සෑම වර්ෂ 5 කට වරක් ශේෂ, ගිණුම් පොත් වලින් ඉවත් කරන අතර,ඒ අනුව 2019 වර්ෂයට අදාල ශේෂ 2024 වර්ෂයේදී නිරවුල් කෙරේ.<br><br>2019 වර්ෂයට පසුව ලද තැන්පතු ,අදාල ශාඛාව විසින් ගණුදෙනුකරු හඳුනාගන්නා තුරු ගිණුම් පොත්වල තබාගන්නා අතර සහ එය අදාල පහසුකමට අරමුදල් මාරු කිරීම සඳහා අනුමැතිය සමග මූල්‍ය අංශයට යවනු ලැබේ.<br><br>**ඉදිරිපත් නොවූ ගෙවීම්**<br><br>ගෙවීම් සිදුකර මාස 06 කට වැඩි කාලයක් ඉදිරිපත් නොවීම් මෙම ගිණුමට මාරු කෙරේ.<br><br>වගකීම් ගිණුමට මාරු කරන අවස්ථාවේදී වගකීම නිරවුල් කිරීමට මෙම තොරතුරු අදාල අංශ වෙත යැවේ.<br><br>මෙම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය වූ විට පසුව කරන ලද ගෙවීම් පිටපත් කෙරේ.<br><br>වර්තමාන දිගුකාලීන හිඟ ශේෂ ප්‍රතිපත්තියට අනුව සෑම වර්ෂ 5 කට | දීර්ඝ කාලීන හිඟව පවතින ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට හා සමාගමේ නියෝග සහ ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු බව නිර්දේශ කෙරේ. |

**හිඟ කාලසීමාව (වර්ෂ)**

| විස්තරය | 0-1 | 1-3 | 3-5 | වර්ෂ 5 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|
| | (රු.මි) | (රු.ම) | (රු.මි) | (රු.මි) | (රු.මි) |
| හඳුනා නොගත් සෘජු තැන්පතු | 2.32 | 6.78 | 5.12 | - | 14.22 |
| ඉදිරිපත් නොවූ ගෙවීම් | 0.63 | 0.14 | 0.65 | 1.98 | 3.40 |
| පාරිභෝගික එකතු කිරීමේ ගිණුම් | .27 | 1.68 | 0. 2 | 100.44 | 107.51 |
| උපලේඛණගත නොවන ගෙවීම් එකතු කිරීම් | 1.02 | 0.12 | 0.005 | - | 1.15 |
| මියගිය ගනුදෙනුකරුවන්ගේ ගෙවිය යුතු තැන්පතු | 1.29 | 0.3 | 0.6 | - | 2.19 |
| උපචිත වියදම් | 12.02 | 0.04 | 0.04 | - | 12.1 |
| කාලීන මුදල් වියපැහැදම් ගිණුම් | - | 3.1 | - | - | 3.17 |
| **එකතුව** | **22.55** | **12.23** | **6.54** | **102.42** | **143.74** |

වරක් ශේෂ, ගිණුම් පොත් වලින් ඉවත් කරන අතර 2019 වර්ෂයට අදාල ශේෂ 2024 වර්ෂයේදී නිරවුල් කෙරේ.

**පාරිභෝගික එකතු කිරීමේ ගිණුම්**

නවරා කැපිටල් ලිමිටඩ් විසින් ගොනු කරන ලද නීතිමය නඩුවට අදාළ ප්‍රධාන සංරචකය රු. මිලියන **100** ක් වන අතර මෙම මුදල නීතිමය නඩුව අවසන් වන තෙක් ගිණුම් පොත්වල තබා ගත යුතුය.

2017 - රු. **18,340/** ක් වටිනාකමක් සහිත ආපසු ලබා දුන් ස්ථාවර තැන්පත් ලදුපත **- 2024** ජනවාරි මාසයේදී නිරවුල් කරන ලදී.

ණයකර ගෙවීමකට අදාල වන රු. **426,580.82** ක් මියගිය ගණුදෙනුකරුවෙකුට අයත් වන අතර ඔහුගේ උරුමක්කාරයන් මෙම අරමුදල් උසාවි නියෝගයක් හරහා ඉල්ලා සිටිය හැක.

මෙය ආයතනික උපදේශන සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ දෙපාර්තමේන්තුව විසින් නොකඩවා අනුගමනය කරනු ලැබේ.

ගණුදෙනුකරුවන් විසින් පහසුකම් පියවීමෙන් පසු තවත් ශේෂයන් කිහිපයක් ඉතිරිව ඇත. අදාල ගණුදෙනුකරුවන්ගෙන් තහවුරු කිරීම ලැබුණු විට, එම මුදල ගිණුම් පොත් වලින් නිරවුල් කළ හැකිය.

වර්තමාන දිගුකාලීන හිඟ ශේෂ ප්‍රතිපත්තියට අනුව 2019 වර්ෂයට අදාල ශේෂ 2024 වර්ෂයේදී නිරවුල් කෙරේ.

**උපලේඛණගත නොවන ගෙවීම් එකතු කිරීම්**

රු.4,500 -වර්ෂ 3-5 අතර ඇති ශේෂය 2024 අගෝස්තු මාසයේදී නිරවුල් කෙරේ.

රු. 122,400/- අංක4548218 දරන වාහන ණය බැහැර කිරීමේදී එකතු කරන ලද අතිරික්තය

රු. 1,023,000/- 8055317, 8763981, 7718901, 7412119 වාහන බැහැර කිරීමේදී එකතු කරන ලද අතිරික්තය

මෙම සියළු ශේෂයන් 2024 අගෝස්තු මාසයේදී නිරවුල් කෙරේ.

**මියගිය ගනුදෙනුකරුවන්ගේ ගෙවිය යුතු තැන්පතු**

රු.377,740.55 ක් පියවීමට නීතිමය ප්‍රතිඵලය බලාපොරොත්තුව සිටී.

රු.144,480.12 ක් නාමිකයාට ගෙවිය යුතුය. සිහිකැඳවීම යැවිය යුතුය.

රු.493,861.10 ශේෂ ගෙවීම 2 වන නීත්‍යානුකුල උරුමක්කරු (විදේශීය) වෙත ගෙවිය යුතුය.

රු. 647, 587.55 අවසන් කිරීම සඳහා නීතිමය ලියකියවිලි ඉල්ලා පරිපාලක වෙත ලිපියක් යැවිය යුතුය.

රු.525,931.30 නීත්‍යානුකුල උරුමක්කරුවන් සම්බන්ධ කර ගැනීමට නොහැකි විය. ශේෂය නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස මියගිය ලිපිනයට ලිපියක් යවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| | | **උපචිත වියදම්**<br><br>රු.35,700- වර්ෂ 3-5 හි ඇති බදු උපදේශනය සඳහා අමරසේකර සහ සමාගමට ගෙවිය යුතුය. ගෙවීම් සැසඳීමෙන් පසු 2024 දෙසැම්බර් මාසයට පෙර නිරවුල් කෙරේ.<br><br>රු. **41,900/-** වර්ෂ 1-3 හි ඇති ජෙනරේටරය සඳහා නේටිව්වේ (**Nativeway**) වෙත ගෙවිය යුතුය. අඩි වෙන් කිරීම, ගෙවීම් සැසඳීමෙන් පසු 2024 දෙසැම්බර් මාසයට පෙර උපකාරක සේවා අංශය විසින් නිරවුල් කෙරේ.<br><br>රු. **12,025,500/-** වර්ෂ 0-1 හි ඇති 2023 වර්ෂයේ වාර්ෂික මහා සභා රැස්වීම හා වාර්ෂික වාර්තා මුද්‍රණය, මානව සම්පත් පාරිතෝෂික, නිවාඩු මුදල් ගෙවීම**,** උකස් මත රක්ෂණය**,** **Mcash** සහ නියෝජිතායතන කොමිස් ගෙවීම් වලට අදාල වේ.<br><br>**කාලීන මුදල් වියපැහැදම් ගිණුම්**<br><br>ස්ථාවර තැන්පත් අංශය විසින් මෙම ශේෂය 2024 පෙබරවාරි මාසයේදී නිරවුල් කර ඇත. | |

### 1.5.3 අත්තිකාරම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 වන දිනට ප්‍රධාන අක්‍රිය ණයදෙනුකරුවන් 10 දෙනාගේ හිඟ ශේෂ එකතුව රු. මිලියන 1,075.34 ක් වන අතර එය එදිනට සමාගමේ මුළු අක්‍රිය දළ ණය හා අත්තිකාරම් වලින් සියයට 16.44 ක් නියෝජනය කරයි. විස්තර පහත දැක්වේ. | **1. කෝපරේට් රිස්ක් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම**<br>ප්‍රතිචාරය 3:2 මෙහෙයුම් අකාර්යක්ෂමතා හි (iv) යටතේ දක්වා ඇත.<br><br>**2. කෙන්ට් හයිඩ්‍රෝ (පුද්) සමාගම**<br>ඉල්ලුම් ලිපිය 2023/09/08 දින යවා ඇත. පවත්නා නිරවුල් කරගැනීමේ සාකච්ඡා හේතුවෙන් ක්‍රියාමාර්ග ගොනු කිරීමෙන් වලකින ලෙස අයකිරීම් දෙපාර්තමේන්තුව නීති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර | අක්‍රිය ණයදෙනුකරුවන් ගෙන් හිඟ මුළු මුදල අයකර ගැනීමට සමාගම විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය බව නිර්දේශ කෙරේ. |

| | ණයදෙනුකරුගේ නම | මුළු හිඟ මුදල (රු. මිලියන) |
|---|---|---|
| 1 | කෝපරේට් රිස්ක් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම | 245.57 |
| 2 | කෙන්ට් හයිඩ්‍රෝ (පුද්) සමාගම | 194.33 |
| 3 | ඒ පී ඒ ජුවලරි (පුද්) සමාගම | 163.75 |

| | | |
|---|---|---|
| 4 | මැග් ස්ටෝරේජ් බැටරි (පුද්) සමාගම | 142.62 |
| 5 | වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පැනි ඉංජිනියරින් (පුද්) සමාගම | 81.05 |
| 6 | දයා ගෘප් (පුද්) සමාගම | 79.97 |
| 7 | වැව්ලි සංවර්ධන සහ කළමණාකරන (පුද්) සමාගම | 52.34 |
| 8 | ආචාර්ය යූ.ජී.එ්.ප්‍රනාන්දු | 42.05 |
| 9 | සීගිරිය වයිස්රෝයි හොටෙල් (පුද්) සමාගම | 39.11 |
| 10 | අනුර මැන් පවර් සප්ලයර්ස් (පුද්) සමාගම | 34.55 |
| **එකතුව** | | **1,075.34** |

ඇත.

සේවාදායකයා සෑම මසකම එක් වාරිකය බැගින් ගෙවමින් සිටී. සම්පූර්ණ නිරවුල් කිරීමකට සාකච්ඡා පැවතෙමින් තිබේ.

**3.ඒ පී ඒ ජුවලරි (පුද්) සමාගම**

1D සහ 4D - DECREE NISI නිරපේක්ෂ බවට පත් කර ඇත. 2D සහ 3D - විදේශ ලිපිනයට දැන්වීම් ලබා දීමට පියවර ගත යුතුව ඇත.

සේවාදායකයා සමග බේරුම්කරණ සැලැස්ම සාකච්ඡා කර ඇති අතර රු. මිලියන 92 ක් එකතු කරගෙන ඇත.

**4. මැග් ස්ටෝරේජ් බැටරි (පුද්) සමාගම**

ගොනු කර ඇති නීතිමය නඩු මත පදනම්ව වැඩිදුර නඩු විභාග සිදු වෙමින් පවතී.

**5. වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පැනි ඉංජිනියරින් (පුද්) සමාගම**

පිළිවෙලින් 2024/08/02 සහ 2024/02/19 යන දිනවලදී නඩු 2 කට පක්ෂව තීන්දු ලබා දෙන ලදී.

මණ්ඩලයේ අනුමැතිය ඇතිව රු. මිලියන 100 ක ආපසු ගෙවීමේ සැලැස්ම පාරිභෝගිකයාට ලබා දී ඇති අතර රු. මිලියන 5.0 එකතු කරගෙන ඇත.

**6. දයා ගෘප් (පුද්) සමාගම**

පියවීමේ නියමයන්ට 2024/06/11 දින ඇතුළත් විය.

රු.මිලියන 78.50 ක බේරුම්කරණ සැලැස්ම සඳහා උසාවියේදී එළඹුණු අතර මේ දක්වා රු. මිලියන 10 ක් එකතු කරගෙන ඇත.

**7. වැවිලි සංවර්ධන සහ කළමණාකරන (පුද්) සමාගම**
ප්‍රතිචාරය 3:2 මෙහෙයුම් අකාර්යක්ෂමතා හි (vii) යටතේ දක්වා ඇත.

**8. ආචාර්ය යූ.ජී.එර්.ප්‍රනාන්දු**

වැඩිදුර නඩු විභාගය 2024/11/05 දිනට යෙදී ඇත.

**9. සීගිරිය වයිස්රෝයි හොටෙල්ස් (පුද්) සමාගම**

ප්‍රතිචාරය 3:2 මෙහෙයුම් අකාර්යක්ෂමතා හි (vi) යටතේ දක්වා ඇත.

**10. අනුර මැන් පවර් සප්ලයර්ස් (පුද්) සමාගම**

ප්‍රතිචාරය 3:2 මෙහෙයුම් අකාර්යක්ෂමතා හි (viii) යටතේ දක්වා ඇත.

**1.5.4 තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පාලන**

| **අංකය** | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | උපස්ථ (backup) මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා සමාගම විසින් Commvault උපස්ථ කළමනාකරණ මෙවලම භාවිතා කරන අතර එය නවතම අනුවාදය නොවේ. එය, දත්ත කඩකිරීමේ සම්භාවිතාව වැඩි කිරීම මගින් වැදගත් යාවත්කාලීන සහ අණ්ඩ (patch) ලබා ගැනීමට නොහැකි වීමට හේතු විය හැක. | අපි දැනට විගණකවරුන් විසින් මතු කරන ලද ගැටළු විසඳීමට සහ වෙනත් මෙහෙයුම් ගැටළු කිහිපයක් විසඳීම සඳහා නව උපස්ථ විසඳුමක් ලබා ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටිමු.<br><br>2024 දෙසැම්බර් 31 වන විට ක්‍රියාත්මක කිරීම අවසන් කිරීමට අපි සැලසුම් කරමින් සිටිමු. | උපස්ථ දත්ත මෙහෙයුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියේ නවතම අනුවාදය භාවිතා කිරීම නිර්දේශ කෙරේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 20.8 ක ලාභයක් වූ අතර පෙර වර්ෂයේ එයට අනුරූප අලාභය රු. මිලියන 495.6 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 516.4 ක වැඩිදියුණුවීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මුළු මෙහෙයුම් ආදායම රු. මිලියන 714.9 කින් වැඩිවීම මෙම වැඩිදියුණුවීමට ප්‍රධානම හේතුව විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ ප්‍රවනතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම පෙර වර්ෂය හා සැසඳීමේ දී වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමග පහත දක්වා ඇත.

| විස්තරය | 2023 (රු. '000) | 2022 (රු.'000) | වෙනස (%) | විචලනයට හේතුව |
|---|---|---|---|---|
| පොළිය සහ සමාන ආදායම | 6,559,123 | 6,451,083 | **1.67** | වෙනත් වීස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය ආයෝජන වැඩිවීම සහ බැංකු හා මූල්‍ය ආයතන වෙත ණය ලබාදීම පොළී ආදායමේ සුළු වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. |
| පොළිය සහ සමාන වියදම | 4,918,658 | 4,695,684 | 4.75 | තැන්පතු පදනමේ සහ සමාගමේ ණය ගැනීම් වැඩිවීම පොළී වියදම වැඩිවීමට හේතු වී තිබුණි. |
| ගාස්තුව සහ කොමිස් ආදායම | 123,292 | 129,157 | (4.54) | වෙළඳ හා වෙනත් අදාල ක්‍රියාකාරකම්වල අඩුවීම ගාස්තු සහ කොමිස් ආදායම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. |
| ශුද්ධ වෙළෙඳ ආදායම | 120,243 | 3,658 | 3,187.0 | ලාභ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම් බැහැර කිරීමෙන් වන ලාභය ඇතුළුව වෙළඳ ක්‍රියාකාරකම් තුලින් ප්‍රතිඵලය වැඩිවී තිබුණි. |
| වෙනත් මෙහෙයුම් ආදායම | 116,167 | 90,826 | 27.90 | දේපල හා උපකරණ බැහැර කිරීම් ලාභය , නිශ්චල දේපල වලින් ලාභ සහ අලාභ පහළ යාම අතර ආශ්‍රිතයන්ගෙන් ලාභාංශ ආදායම සහ වෙනත් ආදායම් වැඩිවීම වෙනත් මෙහෙයුම් ආදායමේ වැඩිවීමට හේතු වී තිබුණි. |
| ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් | 25,094 | 16,504 | 52.05 | තනි පුද්ගල සැලකිය යුතු ණය සඳහා වූ හානිකරණය සහ සාමූහික ණය මත හානිකරණය ගණනය කිරීම වැඩිවීම සහ ලියා හැරීම් අඩුවීම, ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. |

### 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂය සඳහා සමාගමේ ඇතැම් වැදගත් අනුපාත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද ආංශික අනුපාත වලට සාපේක්ෂව පහත දක්වා ඇත.

| විස්තරය | ආංශික අනුපාතය * | සමාගම 2023 | 2022 |
|---|---|---|---|
| **කාර්යසාධන අනුපාත** | | | |
| හිමිකම් මත ප්‍රතිලාභ (ROE) | 12.09 | 0.57 | (12.60) |
| වත්කම් මත ප්‍රතිලාභ (ROA) | 4.23 | 0.06 | (1.51) |
| පොළී ආන්තිකය | 7.74 | 5.55 | 5.85 |
| **වත්කම් තත්ත්ව අනුපාතය** | | | |
| දළ අක්‍රීය අත්තිකාරම් (NPL) | 17.76 | 19.32 | 17.77 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත** | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවම 8.50%) | 21.13 | 13.60 | 11.33 |
| මුළු ප්‍රාග්ධනය (අවම 12.50%) | 22.33 | 16.75 | 12.01 |
| **ව්‍යවස්ථාපිත අනුපාතය** | | | |
| ද්‍රවශීල වත්කම් අනුපාතය | 14.09 | 11.59 | 13.41 |

*** ආංශික අනුපාත ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ මුල්‍ය අංශය - බලපත්‍රලාභී මුල්‍ය සමාගම් යටතේ උපුටා ගන්නා ලදී.**

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී, ආපසු අයකර ගැනීමට නොහැකිවීම මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ එකතුව රු.මිලියන 64.09 ක් වූ අක්‍රිය ණය සහ අත්තිකාරම් 127 ක් ලියා හැර තිබුණි. . | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ලියාහැරීම් ප්‍රතිපත්තියෙහි දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුව, දිගු කාලයක් තුල නොලැබුණු ගෙවීම්/ අනාරක්ෂිත ඉවත්කිරීම් ශේෂ වැනි පහසුකම් ලියාහැරීමට කළමනාකරණය තීරණය කරනු ලබයි. කෙසේ වෙතත්, ලියාහැරීමට පෙර | ණය හා අත්තිකාරම් ලියා හැරීමට ප්‍රථම ආපසු අයකර ගැනීමට හැකි සෑම ප්‍රයත්නයක්ම ගැනීම නිර්දේශ කෙරේ. |

හිඟ ගෙවීම් එකතුකර ගැනීමට හැකි සියළු අයකරගැනීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර පහසුකම සම්පූර්ණයෙන් නිරවුල් වන තුරු නීතිමය ක්‍රියාවලිය තවදුරටත් පවත්වාගෙන යනු ලබයි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂය තුල සමාගම විසින් නැවත අත්කරගත් වාහන 113 ක් අලෙවි කර තිබුණි. කෙසේ වෙතත්, එම වාහන 113 අතරින් වාහන 98 ක් තක්සේරු වාර්තාවේ සඳහන් බල කරන ලද විකුණුම් වටිනාකමට වඩා අඩු මිලකට අලෙවි කර තිබුණි. මෙම ගණුදෙනුවෙන් සමාගමට සිදුවූ සමස්ත පාඩුව රු.මිලියන 18.05 කි | වාහන අංගන මෙහෙයුම් ක්‍රියාපරිපාටියේ නිර්ණායක තුල වාහන බැහැර කිරීම සිදු කරනු ලැබේ.<br><br>කෙසේ වෙතත්, බල කරනලද විකුණුම් වටිනාකමට සියයට 20 කට වඩා අඩුවෙන් වාහන බැහැර කළද , සියළුම වාහන ගණුදෙනු<br><br>ලාභ මත බැහැර කිරීමට සමාගමට කළමනාකරණය කරගැනීමට හැකිවිය. තවද , අත්කරගත් වාහනවල සැබෑ වෙළඳපල වටිනාකම් සාමාන්‍ය තක්සේරුවලට වඩා සාපේක්ෂව අඩුය. වාහන අංගන මෙහෙයුම් ක්‍රියාපරිපාටිය ප්‍රකාරව, බල කරනලද විකුණුම් වටිනාකමට සියයට 80 කට වඩා ඉහලින් වාහන බැහැර කිරීමට බැහැර කිරීමේ කමිටුව තීරණය කර තිබුණි.<br><br>පවතින කලබලකාරී කාලය තුළ හැකි සෑම විටම වත්කම් උපලබ්ධි කර ගැනීම ආර්ථික තීරණයක් වන අතර, එම හිඟය අයකරගැනීමේ ක්‍රියාවලිය හරහා ගණුදෙනුකරුවන්ගෙන් අයකර ගැනීමට අපේක්ෂා කරන බව උපකල්පනය කරමින් එවැනි බැහැර කිරීමේ තීරණ ගන්නා ලදී. | අත්කරගත් වාහන විකිණීමෙන් සමාගමට සිදුවිය හැකි පාඩු අවම වන පරිදි කටයුතු කළ යුතු බව නිර්දේශ කෙරේ. |
| (ආ) | සමාගම විසින් වාහන 23 ක් සුරැකුම් ලෙස තබාගෙන එකතුව රු.මිලියන 30.27 ක්වූ කල්බදු පහසුකම් ගණුදෙනුකරුවන්ට ලබාදී තිබු අතර ඒවා අත්පත් කරගැනීමෙන් පසු 2023 වර්ෂය තුළදී අලෙවි කර තිබුණි. කෙසේ වෙතත්, රු. මිලියන 15.71 පමණක් ලැබී තිබුණ අතර | ගණුදෙනුකරුවන් ලබා ගන්නා බොහෝ පහසුකම් ඉදිකිරීම් කටයුතුවලට අදාළ සේවාවන් සැපයීම සඳහා වේ. වසංගතයට පෙර පහසුකම් ප්‍රදානය කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පැවති වෙළඳපල තත්ත්වයන් හේතුවෙන් වාහනවල පිරිහුණු | සමාගමට සිදුවිය හැකි පාඩු අවම වන පරිදි විචක්ෂණශීලීව තීරණ ගැනීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | ශේෂය වන රු.මිලියන 14.56 ක් තවමත් ණයදෙනුකරුවන්ගෙන් අයකරගත යුතුව තිබුණි.එබැවින් වාහන බැහැර කිරීමෙන් පසුවද අඩු තරමින් වියපැහැදම් කළ මුදලවත් අයකරගැනීමට සමාගමට නොහැකි වී තිබුණි. ඉහත සඳහන් මුදල ණයදෙනුකරුවන්ගෙන් අයකරගැනීමට නොහැකිවීම මත සමාගමට පාඩුවක් දැරීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය. | තත්ත්වය, පිරිනැමීම් අගයන් අඩුවීම ආදිය සිදු විය.කෙසේ වෙතත්, සෘජු සාකච්ඡා, බාහිරින් නියෝජිතයින් ලබා ගැනීමෙන් සහ නඩු පැවරීමේ ක්‍රියාවලිය වැනි අයකරගැනීමේ ක්‍රියාමාර්ග හරහා ගනුදෙනුකරුවන්ගෙන් ඉතිරි මුදල් අයකර ගැනීමට කළමනාකාරිත්වය හැකි සෑම පියවරක්ම ගනිමින් සිටී. | |
| (ඇ) | අත්කරගත් වාහන අංගනයෙන් බැහැර කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. 2024 මැයි 31 දිනට, අංගනයෙහි නවතා තිබූ වාහන 115 ක් අතරින් වාහන 65 ක් දීර්ඝ කාලයක සිට එහි නවතා තිබුණි. එය වර්ෂ ගණනාවක් පුරා අධික නඩත්තු පිරිවැයක් දැරීමටත්, වාහනවල වෙළඳපල වටිනාකම අඩුවීමෙන් පාඩු සිදුවීමටත් හේතුවිය හැක.වාහන නවතා තැබීමේ කාලසීමාවට අදාල විස්තර පහත දැක්වේ.<br><br>**අංගනයේ නවතා තිබූ කාලසීමාව** — **වාහන සංඛ්‍යාව**<br>වර්ෂ 1-3 — 19<br>වර්ෂ 3-5 — 09<br>වර්ෂ 5 ට වැඩි — 37<br>**එකතුව** — **65** | ලැයිස්තුගත වාහන 65 අතරින් 52 ක් උසාවි බැඳුණු වාහන වන අතර බැඳුම්කරය උසාවිය හරහා අවලංගු වන තුරු ඒවා බැහැර කළ නොහැක. ගනුදෙනුකරුවන්ගෙන් සිදුවන ආර්එම්වී (RMV) විරෝධතා හේතුවෙන්, එම ගනුදෙනුකරුවන්ගේ බලපෑම් අවලංගු කරන තුරු වාහන 03 ක් බැහැර කළ නොහැකි අතර, ලැයිස්තුවේ ඇතුළත් කර ඇති වාහන 01 ක් ඒ අනුව බැහැර කර මුදා හරින ලදී. ඉතිරි වාහන 09 , දැනටමත් ලබාගෙන ඇති මණ්ඩල අනුමැතිය අනුව 2024 අගෝස්තු 16 දින දඹුල්ල අංගනයේදී පැවැත්වීමට නියමිත වෙන්දේසි ක්‍රියාවලිය හරහා බැහැර කෙරේ. | බැඳුම්කර උසාවියෙන් නිදහස් කරගැනීමට සියළු උත්සාහයන් දැරිය යුතු අතර සමාගමට අවම පාඩුවක් වන පරිදි අත්කරගත් වාහන බැහැර කිරීම නිර්දේශ කෙරේ. |
| (ඈ) | සමාගම විසින් 2019 සිට 2021 දක්වා කෝපරේට් රිස්ක් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත කෙටි කාලීන ණය සහ සහන ණය පහසුකම් ප්‍රදානය කර තිබුණි. 2021 වර්ෂයේදී එම ණයදෙනුකරුගේ අවිධිමත් ගෙවීම් රටාව සහ එම ණයදෙනුකරුගේ ඉල්ලීම අනුව පසුගිය ගෙවීම් ඉතිහාසය නොසලකා සමාගම විසින් ඉහත සියළු ණය රු.මිලියන **250.32** ක එක් ණය මුදලකට හරවා පහසුකම ප්‍රතිව්‍යුහගත කර තිබුණි. ප්‍රතිව්‍යුහගත පහසුකම පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | ණය පහසුකම් ලබා දීමේදී ණය ප්‍රතිපත්ති උපදෙස් සහ ලේඛනවල නිරවද්‍යතාවය නිවැරදිව ඇගයීමට ලක් කළ යුතු බව නිර්දේශ කෙරේ |

| | |
|---|---|
| • ණය පරිපාටික අත්පොතෙහි සඳහන් උපදෙස්වලට පටහැනිව උකස් කරන ලද දේපලෙහි බලකරන ලද විකුණුම් අගය (FSV) ඉක්මවා මුළු ණය මුදල ලබා දී ඇත. කෙසේ වෙතත්, බලකරන ලද විකුණුම් අගය ඉක්මවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාගෙන ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත |
| • ණය ගන්නා සමාගමේ මූල්‍ය තත්ත්වය ඇගයීම සඳහා සමාගම විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබාගෙන නොතිබුණි. | අදහස සමඟ එකඟ විය |
| • සමාගම පුද්ගලික ඇපකරුට දන්වා නොතිබූ අතර ඇපකරුට එරෙහිව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස සමඟ එකඟ විය |
| • ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ සමස්ත අවදානම අවම කිරීම සඳහා ණය කමිටුව විසින් නිර්දේශ කරන ලද පහත සඳහන් උපාය මාර්ග සමාගම විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>ණය කමිටුව විසින් නිර්දේශ කරන ලද උපාය මාර්ග<br><br>I 2020/2021 මුදල් වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබා ගත යුතුය.<br><br>II අනාගත ව්‍යාපාර සැලසුම්, සමාගමේ පවතින / යෝජිත ව්‍යාපාර ව්‍යාපෘති පිළිබඳ විස්තර සහ පුරෝකථනය කළ මූල්‍ය ප්‍රකාශන ලබා ගත යුතුය.<br><br>III පහසුකම් සම්පූර්ණයෙන් පියවා ගැනීම දක්වා අයදුම්කරන සමාගමේ ව්‍යාපාර කාර්ය සාධනය, CRIB වාර්තා සහ මුදල් ප්‍රවාහ තත්ත්වය පිළිබඳව වරින් වර සමාලෝචන පැවැත්විය යුතුය. 1 වන සමාලෝචනය ප්‍රතිව්‍යුහගත කළ ණයෙන් | අදහස සමඟ එකඟ විය |

| | | | |
|---|---|---|---|
| | මාස 6ක් ඇතුළත සිදු කළ යුතු අතර පශ්චාත් ණය අධීක්ෂණ ඒකකය/මධ්‍යම ව්‍යාපාර ඒකකය මගින් ණය කමිටුවට වාර්තා කළ යුතුය. | | |
| (ඉ) | සමාගම 2014 සිට 2017 දක්වා රෙදිපිළි වෙළඳපොලේ කීර්තිමත් සිල්ලර වෙළෙන්දෙකු වන රංජනාස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත චක්‍රීය සහ කාලීන ණය පහසුකම් ප්‍රදානය කර ඇත. දැනට පවතින පහසුකම් සඳහා ආපසු ගෙවීම නොකඩවා සිදු නොවන බැවින්, සමාගම 2019 අගෝස්තු මාසයේදී පවත්නා කාලීන ණයෙහි හිඟ ශේෂය වන රු. මිලියන 25.22 ක මුදලකට ප්‍රතිව්‍යුහගත කර ඇත. ප්‍රතිව්‍යුහගත පහසුකම පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | ණය පහසුකම් ලබා දීමේදී ණය ප්‍රතිපත්ති උපදෙස් සහ ලේඛනවල නිරවද්‍යතාවය නිවැරදිව ඇගයීමට ලක් කළ යුතු බව නිර්දේශ කෙරේ |
| | • ක්‍රියාපටිපාටි අත්පොතෙහි 3.0 වගන්තියට අනුව, ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට පෙර දැඩි පාලන ක්‍රම යොදවා පසු විපරම් කර නොතිබූ අතර අධීක්ෂණය සහ සුපරීක්ෂණ කොටස නිසි ලෙස සිදු කර නොතිබුණි. | අදහස සමඟ එකඟ විය | |
| | • නිසි ඇපකරු ඇගයීමක් සිදු කර නොතිබුණි. | අදහස සමඟ එකඟ විය | |
| | • ණය ලබා ගත් සමාගමේ මූල්‍ය තත්ත්වය ඇගයීම සඳහා සමාගම විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබාගෙන නොතිබුණි. | අදහස සමඟ එකඟ විය | |
| | • ණයට ගත් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු වාරික 3ක් ගෙවා ඇති අතර, 2023 දෙසැම්බර් මාසයේ ඉල්ලීම් ලිපිය නිකුත් කරන ලදී. ගණුදෙනුකරු විසින් 2024 පෙබරවාරි සිට මසකට රු.500,000 බැගින් වූ ප්‍රාග්ධන ආපසු ගෙවීමක් කරගෙනයනු ලබයි. | සමාගම නැවතත් 2024 පෙබරවාරි සිට මසකට රු.500,000 බැගින් ප්‍රාග්ධන ආපසු ගෙවීම් සිදු කරන අතර ඒ අනුව දැනටමත් රු. මිලියන 3.5 ක් ගෙවා ඇත. | |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාගම විසින් 2010 මැයි මාසයේදී සීගිරිය වයිස්රෝයි හොටේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත රු.මිලියන 34.14 ක කාලීන ණය පහසුකමක් ප්‍රදානය කර තිබුණි. මෙම ණය පහසුකම 2014 දෙසැම්බර් මාසයේදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | සමාගම විසින් මුළු හිඟ මුදල ගණුදෙනුකරුගෙන් හෝ ඇපකරුගෙන් අය කර ගැනීම සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගත යුතු බවට නිර්දේශ කෙරේ. |
| | • ප්‍රදානය කරන ලද ණය මුදල උකසට තබා ඇති දේපලෙහි බල කරන ලද විකිණීමේ වටිනාකමට වඩා වැඩි විය. | අදහස සමඟ එකඟ විය | |
| | • සුරැකුම ලෙස උකසට තබා ඇති දේපළෙහි හිමිකාරිත්වය සම්බන්ධයෙන් යම් නීතිමය ගැටලු තිබුණි. | අදහස සමඟ එකඟ විය | |
| (උ) | සමාගම විසින් ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ ප්‍රවීණයකු වන සීමිත වගකීම සහිත සමාගමක් වන ප්ලාන්ටේෂන්ස් ඩිවලප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත රු. මිලියන 52.34 ක කාලීන ණය පහසුකමක් ප්‍රදානය කර තිබුණි. සුරැකුම් ලෙස දේපල 2 ක් හා එක් පුද්ගල ඇපයක් ලබාගෙන තිබුණි. වාරික මුදල් නොගෙවීම මත මෙම ණය පහසුකම 2014 දෙසැම්බර් මාසයේදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | ණය පහසුකම් ලබා දීමේදී ණය ප්‍රතිපත්ති උපදෙස් සහ ලේඛනවල නිරවද්‍යතාවය නිවැරදිව ඇගයීමට ලක් කළ යුතු බව නිර්දේශ කෙරේ. |
| | • මෙම පහසුකම් සඳහා උකස් කර ඇති දේපල රජයේ බදු දේපල වේ. | අදහස සමඟ එකඟ විය | |
| | • ණය ගත් සමාගමේ අධ්‍යක්ෂවරයා සොයා ගත නොහැක. | අදහස සමඟ එකඟ විය | |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දේපල උකසක් මත, 2010 දී රු. මිලියන 20 ක හා රු.මිලියන 5 ක ණය පහසුකම් දෙකක් අනුර මැන්පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කර තිබුණි. වාරික මුදල් නොගෙවීම මත මෙය 2010 දී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි.තවද ගණුදෙනුකරු විසින් 2012 වර්ෂයේදී ඉහත සඳහන් දේපල ස්වේච්ඡාවෙන් සමාගම වෙත මාරු කර තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | ණය පහසුකම් ලබා දීමේදී ණය ප්‍රතිපත්ති උපදෙස් සහ ලේඛනවල නිරවද්‍යතාවය නිවැරදිව ඇගයීමට ලක් කළ යුතු බව නිර්දේශ කෙරේ. |
| | • ඉඩමට නීත්‍යානුකූල ප්‍රවේශයක් නොමැතිකම සහ එය ගංවතුර ප්‍රදේශයක පිහිටා තිබීම හේතුවෙන් සමාගමට ඉහත දේපල විකිණීමට නොහැකි විය. | අදහස සමඟ එකඟ විය | |
| | • 2022 පෙබරවාරි දිනැති තක්සේරු වාර්තාවට අනුව එහි අගය ශුන්‍ය වේ. | අදහස සමඟ එකඟ විය | |
| (ඔ) | 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු ශාඛා 49 අතරින් ශාඛා 40 ක් එකතුව රු.මිලියන 414.64 ක අලාභයක් වාර්තා කර තිබුණි. ශාඛා 28 කට අදාලව පෙර වර්ෂයේ වාර්තා කර තිබු අලාභ එකතුව රු.මිලියන 227.16 ක් විය. සමාලෝචිත වර්ෂයේ සමස්ත අලාභය සියයට 82.53 කින් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය. ඉතිරි ශාඛා 09 හි වාර්තාගත ලාභය රු. මිලියන 57.86 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුල ශාඛා බහුතරයක් අලාභයක් වාර්තා කර තිබු බව තවදුරටත් නිරීක්ෂණය විය. | අදහස සමඟ එකඟ විය | අලාභ ඉවත් කර ශාඛාවල කාර්ය සාධනය වැඩි කිරීමට අවශ්‍ය පියවර ගැනීම නිර්දේශ කෙරේ. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත සහ උපකරණ**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන දේපල යටතේ පෙන්වා තිබු දේපල 06 අතරින් ,දේපළ 04ක අයිතිය හිමිකර ගැනීමට නීතිමය නඩු ආරම්භ කර තිබු අතර 2024 ජුලි 31 විගණනය දිනය දක්වා ඒවා අවසන් කර නොතිබුණි. | දේපල **04**ක් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර එම නඩු **2024** අගෝස්තු **31** දිනට සිදුවෙමින් පවතී. | සමාගමේ දේපළ නිෂ්ක්‍රීයව තබා නොගෙන කාර්යක්ෂම ලෙස භාවිත කළ යුතුය. |

**ඉතිරි ආයෝජන දේපල 02**

01.ඇඹිලිපිටිය

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රකාර, එම්බීඑස්එල් හි පොත්වල දක්වා තිබු පල්ලෙගම ඇඹිලිපිටිය දේපලට අදාල රු.1,750,000.00 ක මුදලක් අප විසින් ලියාහරින ලද අතර සහ 2024 මැයි මාසයේදී පල්ලෙගම ඇඹිලිපිටිය ආයෝජන දේපල අපගේ පොත් වලින් ඉවත් කරන ලදී.

02.අංක116/4,116/7,116/27, 116/29 1 වන හරස් වීදිය , කොළඹ 11

එකී දේපල එම්බීඑස්එල් හි පොත්වල රු. 1,249,000 ක ගෙනයාමේ පිරිවැයක් සහිත ආයෝජන දේපලක් ලෙස දැක්වෙන අතර, මෑතකදී ලබාගත් මණ්ඩල අනුමැතියට අනුව,කැබලි අංක A - 05, A - 07 සහ A-09 බැහැර කිරීමෙන් එකතු වු රු. 3,981,250 න් එය අයකර ගන්නා ලදී. ඒ අනුව 2024 මැයි මාසයේදී 1 වන හරස් වීදිය , කොළඹ 11 ආයෝජන දේපල අපගේ පොත් වලින් ඉවත් කරන ලදී.

| | | | |
|---|---|---|---|
| (ආ) | අත්පත් කරගත් දින සිට ආයෝජන දේපල වලින් කිසිදු ආදායමක් ජනිත නොවුවත්, 2024 ජුලි 31 විගණන දිනය දක්වා සමාගම විසින් දරන ලද නීති ගාස්තු හා ක්ෂය ප්‍රමාණය පිළිවෙලින් රු.මිලියන 15.3 ක් හා රු. මිලියන 46.9 ක් වේ. මෙම ඉඩම් සහ ගොඩනැගිලි තවමත් කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව නිශ්කාර්යව පවතී. | ඉහත සඳහන් කළ පවතින නඩු කටයුතු හේතුවෙන් ලැයිස්තුගත ආයෝජන දේපල සඳහා ගිණුම්වල සම්පූර්ණ වෙන්කිරීමක් සිදු කර ඇත. එම නිසා මේ අතර කාලයේ කිසිදු ආදායමක් උත්පාදනය නොවේ. | නීති ගාස්තු අඩු කරගැනීම සඳහා ණය ලබාදීම ආරම්භයේදී උකසට තබන ලද දේපලවල නීතිමය අවසරය පිළිබඳ සෑහීමකට පත් විය යුතු අතර සහ මෙම දේපල හරහා ආදායම් උත්පාදනය කරගැනීමට කටයුතු සිදුකළ යුතු බවට නිර්දේශ කෙරේ. |

**3.4** **මානව සම්පත් කළමනාකරණය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2023 වර්ෂය තුල සේවකයින් 154 ක් සමාගමෙන් ඉවත්ව ගොස් ඇති අතර එය 2023 ජනවාරි 01 වන දිනට පැවති සේවක සංඛ්‍යාවෙන් සියයට 17.18 ක් නියෝජනය කරයි. එය සමාලෝචිත වර්ෂය තුල සමාගමේ ඉහළ කාර්ය මණ්ඩල පිරිවැටුමක් පෙන්නුම් කරයි. | සියයට 17.18 ක කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය මූල්‍ය සංවිධානයක් සඳහා ඇත්ත වශයෙන්ම ඉහළ බව අපි පිළිගනිමු. කෙසේ වෙතත්, මෙම ඉල්ලා අස්වීම්වලින් බහුතරයක් අභ්‍යන්තර ආයතනික ගැටළුවලට හේතු වූ ඒවා නොවන බව සඳහන් කිරීම වැදගත්ය. අපගේ කාර්ය මණ්ඩල පිටත්වීම් වලින් සැලකිය යුතු කොටසක් මෙහෙයවනු ලැබුයේ දේශීයව සහ ජාත්‍යන්තරව වඩා හොඳ අවස්ථා සොයන පුද්ගලයින් විසිනි. මූලික අභිප්‍රේරකය වූයේ 2023 දී වැඩි වූ බදු අනුපාත මගින් ශුද්ධ වැටුපට වූ විශාල බලපෑමයි. මෙම බාහිර ආර්ථික සාධකය අපගේ කාර්ය මණ්ඩලයට වඩාත් ආකර්ෂණීය විකල්ප රැකියා සාදන ලදී. ඉහළ යන උද්ධමන අනුපාත ද කාර්ය මණ්ඩල පිරිවැටුමෙහි තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. ආහාර, ගමන් වියදම් සහ නවාතැන් වියදම් ඇතුළුව ඉහළ යන ජීවන වියදම් අවම කිරීමේ උපාය මාර්ගයක් ලෙස සමහර සේවකයින් තම ගම්බිම් වලට සමීප රැකියා සොයා ගැනීමට තීරණය කළහ. මෙම ප්‍රවණතාවය ප්‍රධාන වශයෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර ප්‍රකාශිත වන්නේ, නැවත ස්ථානගතවීමෙන් ඔවුන්ගේ දෛනික වියදම් සැලකිය යුතු ලෙස අඩු කර ගත හැකි බවයි. 2022 සාර්ව ආර්ථික මූල්‍ය අර්බුධය ශ්‍රම වෙළඳපලට ප්‍රබල බලපෑමක් ඇති කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහොමයක් කාර්ය මණ්ඩල සාමාජිකයන් වඩා හොඳ ස්ථාවරත්වයක් සහ අවස්ථා සඳහා විදේශගත වීම තෝරා ගන්නා ලදී. මීට අමතරව, වඩාත් හිතකර ආර්ථික පරිසරයක් තුළ ඔවුන්ගේ සුදුසුකම් සහ වෘත්තීය අපේක්ෂාවන් වැඩි දියුණු කර ගැනීමට අපේක්ෂා කරන අපගේ සේවකයින්ගෙන් සැලකිය යුතු පිරිසක් විදේශයන්හි අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමට පිටත්ව යන ලදී. ඉහළ පිරිවැටුම් අනුපාතයක ඇඟවීම් අප විසින් අවබෝධ කරගෙන මෙම අභියෝගයට මුහුණ දීම සඳහා ක්‍රියාශීලීව ක්‍රියාත්මක වෙමින් සිටිමු. | සමාගමේ මෙහෙයුම් සුමටව ක්‍රියාත්මක කරගෙන යාම සහතික කිරීම සඳහා කාර්ය මණ්ඩල පිරිවැටුම අවම කිරීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගමේ සේවක ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 5.1 වගන්තිය ප්‍රකාර , සෑම සේවකයෙකුම වර්ෂ 5 කට වරක් ස්ථාන මාරු කළ යුතුය.කෙසේ වෙතත්, සමහර ශාඛාවල සේවකයන් වර්ෂ 5 කට වැඩි කාලයක් එම ශාඛාවේම සේවයේ යෙදී සිටින බව නිරීක්ෂණය විය. | සමහර අවස්ථාවලදී නියමිත වර්ෂ 5 ක කාලයට වඩා වැඩි කාලයක් එකම ශාඛාවේ සේවකයින් රැඳී සිටීම මෙම ප්‍රතිපත්තියට අනුකූල නොවන බව අපි පිළිගනිමු. මෙම අපගමනය සඳහා මූලික වූ හේතු වලට 2022 දී අප මුහුණ දුන් අභියෝගාත්මක තත්ත්වයන් සම්බන්ධ වේ.එම වර්ෂය තුල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද සීමාකිරීම් මගින් අපගේ ව්‍යාපාර මෙහෙයුම් වලට සැලකිය යුතු බලපෑමක් එල්ල වූ අතර එය නිත්‍ය සේවක ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට අපට ඇති හැකියාවට සෘජුවම බලපාන ලදී. අතිරේක වශයෙන්, අපි බඳවා ගැනීම් නැවතුමකට මුහුණ දුන් අතර, කාර්ය මණ්ඩල හිඟයකට තුඩු දීමෙන් ස්ථාන මාරුවීම් සහ ආදේශනයන් ඵලදායි ලෙස සිදු කිරීමට අපට ඇති හැකියාව සීමා විය.<br><br>ඉහළ ආරෝපණ අනුපාත සහ කාර්ය මණ්ඩල සංඛ්‍යාව අඩුවීම නිසා මෙම ගැටළුව සංකීර්ණවීමෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වඩ වඩාත් දුෂ්කර විය. තවද, මෙම කාලපරිච්ඡේදය තුළ ඇති වූ ආර්ථික කැළඹීම් සහ ඉහළ උද්ධමනය හේතුවෙන් ජීවන වියදම ඉහළ යාම කාර්ය මණ්ඩලය තම නිවෙස්වලින් බැහැර ශාඛා හෝ තනතුරු වෙත නැවත ස්ථානගත වීමට ඇති අකමැත්ත කෙරෙහි බලපාන ලදී. අපි මෙම අභියෝගවලට මුහුණ දීමට කැපවී සිටින අතර වත්මන් ආර්ථික තත්ත්වයන් සහ මෙහෙයුම් අවශ්‍යතා අනුව අපගේ ක්‍රියා පටිපාටි නැවත තක්සේරු කිරීම සහ සකස් කිරීම මගින් අපගේ ස්ථාන මාරු ප්‍රතිපත්තියට වන අනාගත අනුකූලතාව සහතික කිරීමට ක්‍රියාකාරීව කටයුතු කරමින් සිටිමු. | සමාගමේ සේවක ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කළ යුතු බව නිර්දේශ කෙරේ. |